# ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව

## ඇබෑර්තු

## ස්නායු ශල්‍ය විශේෂඥ වෛද්‍ය තනතුර

## ඉහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්** : කොළඹ විශ්වවිද්‍යාලයේ, වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIM) වෙතින් ස්නායු ශල්‍ය වෛද්‍යවිද්‍යාව පිළිබඳ MD මණ්ඩල සහතිකය (Board Certification) සහිත විශේෂඥ වෛද්‍ය නිලධාරින්, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ විශේෂඥ වෛද්‍ය ලේඛකාධිකාරි සමග ලියාපදිංචි වී විශේෂඥ ලියාපදිංචි අංකය ලබා තිබිය යුතුය.

**වයස** : අයදුම්කරුවන් වයස අවුරුදු 50ට වැඩි නොවිය යුතුය. වයස අවුරුදු 50ට අඩු අයදුම්කරුවන් නොමැති විටදී කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම සඳහා අවුරුදු 50 ට වැඩි අයදුම්කරුවන් සලකා බලනු ලැබේ.

**වැටුප් පරිමාණය** : SL 03 – රු. 210,000/= – 12X6,530/= – රු. 288,360/ – මාසිකව (2027.01.01)

ඊට අතිරේකව රාජ්‍ය අංශයේ ගෙවනු ලබන දීමනා සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන අතිරේක දීමනා ගෙවනු ලැබේ.

**රැකියාවේ නියුක්ත කිරීමේ නියමයන්** : ස්ථිර/ කොන්ත්‍රාත් සහ සේවක අර්ථසාධක අරමුදල් හිමිකම් සහිතව.

රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් ඔවුන් සේවයකරන දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් එවිය යුතු අතර, අයදුම්පතේ පිටපතක් සෘජුව යොමු කළ යුතුය. පත්වීම සඳහා තෝරාගනු ලැබුවහොත් අයදුම්කරු සේවයෙන් නිදහස් කළ හැකි බවට ආයතන ප්‍රධානී වෙතින් ලබාගත් සහතිකයක් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.

පත්කිරීම සිදු කිරීමේ හෝ නොකිරීමේ අයිතිය ශ්‍රී ජයවර්ධනපුර මහා රෝග්‍යශාලාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

අයදුම්කරනු ලබන තනතුර අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

අයදුම්කරුවන් විසින් සම්පූර්ණ ජීව දත්ත හා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ඇතුළත් අයදුම්පත් 2026 මාර්තු 12 වන දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් අය වෙත ලැබීමට සැලැස්විය යුතුය.

**සභාපති,**
**ශ්‍රී ජයවර්ධනපුර මහාරෝග්‍යශාලාව,**
**තලපත්පිටිය, නුගේගොඩ.**
**2025.02.21**